වාර්ෂික වාර්තාව 2022



තිරසර සංවර්ධන සභාව

පටුන

1 තිරසර සංවර්ධන සභාව පිළිබඳව 03

2 සංවිධාන ව්‍යුහය 05

3 සංවිධානයේ ප්‍රධාන කාර්යයන් 07

4 කාර්යය සැලැස්ම 2022 08

5 ඇමුණුම්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 30

විගණකාධිපති වාර්තාව 2022 43

තිරසර සංවර්ධන සභාව පිළිබඳව

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතට අනුව ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම සඳහා වගකීම් සහිත ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස තිරසර සංවර්ධන සභාව (SDC) ස්ථාපිත කරන ලදී.

දැක්ම

සැමට තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක්

මෙහෙවර

පාරිසරික, සමාජීය සහ ආර්ථික සහජීවනය සහතික කරන, සංයුක්ත සහ සමස්ථ ප්‍රවේශයක් තුළින් තිරසර සංවර්ධිත ජාතියක් කරා ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම.

ප්‍රධාන අගයන්

- **වගවීම:** සියලු ක්‍රියාමාර්ග සහ තීරණ වලදී විනිවිදභාවය සහ වගකීම සහතික කිරීම
- **සියල්ල ඇතුළත් කරගැනීම:** සාධාරණ හා තිරසර සංවර්ධනයක් අත්කර ගැනීම සඳහා සියලුම අංශවල සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම
- **නවෝත්පාදනය:** තිරසර සංවර්ධනය ඉදිරියට ගෙන යාම සඳහා නව අදහස්, ප්‍රවේශයන් සහ තාක්ෂණයන් වැළඳ ගැනීම සහ ප්‍රවර්ධනය කිරීම
- **පාරදෘශ්‍යභාවය:** විවෘත හා පැහැදිලි සන්නිවේදනයට කැපවීම, අපගේ ක්‍රියාවලීන් සහ ප්‍රතිඵල වෙත සැමට ප්‍රවේශ විය හැකි බව සහතික කිරීම
- **තිරසර බව:** වර්තමාන පරම්පරාවේ අවශ්‍යතාවලට හානියක් නොවන අයුරින් අනාගත පරම්පරාවේ අවශ්‍යතා සමතුලිත කරමින්, සියලු ක්‍රියාවන්හි තිරසරභාවයේ මූලධර්ම තහවුරු කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය

2022 වර්ෂය

නායකත්වය

සභාපති	අධ්‍යක්ෂ ජනරාල්
කේ.එම්.එම්.සිරිවර්ධන මයා ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය *(2022.06.10 දින සිට)*	චමින්ද්‍ර සපරමාදු මිය *(2020.11.02 දින සිට)*

තිරසර සංවර්ධන සභාවේ සාමාජිකයන්

වෛද්‍ය අනිල් ජාසිංහ මයා
ලේකම්, පරිසර අමාත්‍යාංශය (2021.02.18 සිට 2022.02.17 දින දක්වා)

මහාචාර්ය.අයි.ඒ.යූ.එන්.ගුණතිලක මයා
උද්භිත විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(2021.03.01 සිට 2024.01.17 දින දක්වා)

මහාචාර්ය. ඩී. එම්. එස්. හේමන්ති කාරියවසම් රණසිංහ මිය
වන හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
(2021.03.01 සිට 2024.02.29 දින දක්වා)

ආචාර්ය. රවී ප්‍රනාන්දු මයා
(2021.03.01 සිට 2024.02.29 දින දක්වා)

සම්මානිත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. ඊ.දයාරත්න මයා
ජ්‍යෙෂ්ඨ උපදේශක, වාණිජ දෙපාර්තමේන්තුව, කළමනාකරණ අධ්‍යන හා වාණිජ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය*(2022.08.15 දින සිට)*

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. මයුර සමරකෝන් මයා
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය *(2022.08.15 දින සිට)*


කේ.ඒ.ඩී.කේ. සිරිවර්ධන මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), බස්නාහිර පළාත් සභාව
(2021.02.18 සිට 2022.02.17 දින දක්වා)

දිලේඛා කුඩාච්චි මිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත් සභාව
(2021.02.18 සිට 2022.02.17 දින දක්වා)

ආර්.උමාකාන්තන් මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), උතුරු පළාත් සභාව
(2022.08.15 දින සිට)

කේ.ජී.එස්.නිශ්ශංක මයා
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), මධ්‍යම පළාත් සභාව
(2022.08.15 දින සිට)

සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (මෙහෙයුම්)
සහකාර අධ්‍යක්ෂ - 1
සහකාර අධ්‍යක්ෂ - 2
ගණකාධිකාරි
ති.සං.නි.1
ති.සං.නි.2
ති.සං.නි.3
ති.සං.නි.4
ති.සං.නි.5
ති.සං.නි.6
ති.සං.නි.7
ති.සං.නි.8
ති.සං.නි.9
ති.සං.නි.10
රියදුරු 01
කා.කා.ස. 02

ආයතනික ව්‍යුහය

තිරසර සංවර්ධන සභාව (SDC) එහි කාර්යයන් කාර්යක්ෂමව සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා උපායමාර්ගිකව නිර්මාණය කරන ලද මැනවින් අර්ථ දක්වා ඇති ආයතනික රාමුවක් ඔස්සේ ක්‍රියාත්මක වීමට අපේක්ෂා කෙරේ. සභා ලේකම් කාර්යාලය ප්‍රාථමික අංශ දෙකකට ව්‍යුහගත කර ඇති අතර, එක් එක් අංශයට නිශ්චිත වගකීම් පවරා ඇත:

1 සංවර්ධන අංශය

- ජාතික සහ පළාත් මට්ටමින් තිරසර සංවර්ධන අරමුණු වලට අනුකූල ප්‍රතිපත්ති, රාමු සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම හා ඒකාබද්ධ කිරීම.

- ආංශික උපාය මාර්ග 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට සමගාමීව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.

- පාලනය සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම, දත්ත පාදක කරගත් තීරණ ගැනීම, තිරසර මූල්‍ය පරිසර පද්ධතිය ආදිය ඇතුළුව ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට අවශ්‍ය පසු තලය සංවර්ධනය කිරීමට සහාය වීම.

- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ධාරිතාව ගොඩනැගීම සඳහා පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සැලසුම් කිරීම හා පැවැත්වීම.

- තිරසර සංවර්ධන අරමුණු වල මූලධර්ම සහ ඒවායේ ප්‍රායෝගික යෙදුම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩිදියුණු කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශය හරහා තිරසරභාවය සහ සමගාමීත්වයේ මූලධර්ම සහ ප්‍රමිති ප්‍රවර්ධනය කිරීම.

- ශක්තිමත් අධීක්ෂණ රාමු හරහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.

- ජාතික හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සඳහා සවිස්තරාත්මක ප්‍රගති වාර්තා සකස් කිරීම.

2 මෙහෙයුම් අංශය


- මූල්‍ය කළමනාකරණය, පරිපාලන කටයුතු සහ සැපයුම් සහාය ඇතුළුව දෛනික මෙහෙයුම් අධීක්ෂණය කිරීම.

- පරිපාලන හා මූල්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා පාර්ශ්වකරුවන් අතර ඵලදායී සම්බන්ධීකරණය සහතික කිරීම.


- සභාවේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙහෙයුම් සහාය සැපයීම

සංවිධානයේ ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන සභාව (SDC) රට පුරා තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම සම්බන්ධීකරණ ආයතනය ලෙස සේවය කරයි. එහි ප්‍රධාන කාර්යයන් පහත පරිදිය:



ක්‍රියාකාරී සැලැස්ම 2022



01. තාක්ෂණික/ප්‍රතිපත්ති සහාය

2022 වසරේ දී, ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව (SDCSL) ජාතික හා පළාත් සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම්, තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සමග සමපාත කිරීම සඳහා සැලකිය යුතු තාක්ෂණික හා ප්‍රතිපත්ති සහායක් ලබා දුන්නේය. SDCSL විසින් තිරසර සංවර්ධන ඉලක්ක, ජාතික හා අංශගත සැලසුම්කරණයට ප්‍රවාහගත කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා මඟ පෙන්වීය.

ස්වේච්ඡා ජාතික සමාලෝචනයෙන් (VNR) පසුව, එක් එක් අංශයේ පවතින අඩුපාඩු, විශේෂයෙන් VNR 2022 හි පසුගාමී ප්‍රවණතා පෙන්නුම් කරන ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ සමඟ පශ්චාත්-සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. පරිසර අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සවිස්තරාත්මක සාකච්ඡා ද සිදු කෙරිණි.

මීට අමතරව, පරිසර අමාත්‍යාංශය (ජාතික පරිසර ක්‍රියාකාරී සැලැස්ම 2022-2030), කෘෂිකර්ම අමාත්‍යාංශය (ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය), ජල සම්පාදන අමාත්‍යාංශය (පානීය ජලය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය), අධ්‍යාපන අමාත්‍යාංශය (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව 2023-2033) වැනි අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති මූලාරම්භයන් සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

SDCSL විසින් බලශක්ති අමාත්‍යවරයා සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර, සෑම අංශයකම කාර්යක්ෂමතාව වැඩි කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, සියලු දෙනාට දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති ප්‍රභවයක් සඳහා තිරසර බලශක්ති මාර්ග සිතියමක් අවශ්‍යතාවය පිළිබඳව එහිදී අවධානය යොමු කෙරිණි.

එම සාකච්ඡාවේ දී පවතින ආර්ථික ගැටලු මහඟරවා ගනිමින් බලශක්ති අංශය පුළුල් කිරීම සඳහා හරිත බැඳුම්කරවල අවශ්‍යතාවය, දේශගුණික මූල්‍ය විකල්ප සහ නව්‍ය මූල්‍ය අවස්ථා පැවතීම පිළිබඳව විශේෂයෙන් අවධාරණය කරන ලදී. තවද, එක්සත් ජාතීන්ගේ ආසියානු පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සමාජ කොමිසම (ESCAP) විසින් යෝජනා කරන ලද හරිත බැඳුම්කර රාමුව සහ බලශක්ති සංක්‍රාන්තියට පහසුකම් සැලසීම සඳහා ණය-දේශගුණික හුවමාරුව සහ එක්සත් ජාතීන්ගේ ආයතන වලින් ලබා දිය හැකි මූල්‍ය හා තාක්ෂණික සහාය පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි.






EDUCATION SECTOR IN SRI LANKA





02. SDG කඩිනම් කිරීම සඳහා ආයතනික සම්බන්ධීකරණය සහ සහාය

2022 දී, SDCSL රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර ආයතන හරහා ආයතනික සහයෝගිතා ආරම්භ කර හවුල්කාරිත්වයන් ශක්තිමත් කළේ ය. 2030 වන විට ශ්‍රී ලංකාවේ SDGs කරා ප්‍රගතිය වේගවත් කිරීමේ අවශ්‍යතාවය සලකා බලා, SDG පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් 2021 දී පිහිටුවන ලද්දේ ය. එහි දෙවන රැස්වීම 2022 ඔක්තෝම්බර් මාසයේදී පැවැත්විණි. එය අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර ගරු අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් සහ අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්ගෙන් සමන්විත විය. එම රැස්වීමේ ප්‍රධාන තීරණ පහත පරිදිය:

- ජාතික සන්දර්භය සහ තත්වයන් සැලකිල්ලට ගනිමින්, SDG ඉලක්ක අගයන් සමාලෝචනය කිරීම සහ ජාතික වශයෙන් සුදුසු SDG ඉලක්ක අගයන් හඳුනා ගැනීම සඳහා SDCSL විසින් සකස් කරන ලද කෙටුම්පත් සැකිල්ල අමාත්‍යාංශ වෙත යොමු කිරීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වගකීම් පැවරීම
- තිරසර සංවර්ධන සභාව සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අදාළ SDG සම්බන්ධීකාරකවරුන් (2019 ජනාධිපති චක්‍රලේඛය අනුව පත් කරන ලද) දැනුවත් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත වගකීම් පැවරීම
- SDGs ළඟාකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා තිරසර සංවර්ධනය සඳහා වන ජාතික මෙහෙයුම් කමිටුව වසරකට හතර වතාවක් රැස්වීමට කටයුතු කිරීම
    - ආංශික වශයෙන් SDGs ළඟාකර ගැනීමේ ප්‍රගතිය සහ අමාත්‍යාංශ මට්ටමේ ක්‍රියාකාරී සැලසුම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා අගමැති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සෑම මාස තුනකට වරක් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ රැස්වීම් පැවැත්වීමට කටයුතු කිරීම

මීට අමතරව, SDCSL විසින් අමාත්‍යාංශ මට්ටමින් පිහිටුවන ලද SDG 16 සහ SDG 3 මෙහෙයුම් කමිටු (අධිකරණ අමාත්‍යාංශය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සත්කාරකත්වය සපයනු ලබන), සහ ජාතික පෝෂණ කාර්ය සාධක බලකාය (සෞඛ්‍ය අමාත්‍යාංශය) වැනි නිශ්චිත තිරසර සංවර්ධන අරමුණක් සඳහා පිහිටවූ බහුවිධ මෙහෙයුම් කමිටු සහ කාර්ය සාධක බලකායන් සඳහා සම සභාපතීත්වය දරමින් සම්බන්ධීකරණ හා තාක්ෂණික සහාය ලබා දෙන ලදී. සභාව විසින් GCM (ගෝලීය සංක්‍රමණ සම්මුතිය) ක්‍රියාත්මක කිරීමේ කමිටුවක සභාපතීත්වය දැරීමෙන් ජාත්‍යන්තර ගිවිසුම් සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධතා සම්බන්ධීකරණය කරන ලදී.

SDCL විසින් සිවිල් සමාජය සහ ආගමික ආයතන සමග ඇතිකර ගත් සහයෝගීතාවයන් තුළින් හරිත පුදමිබ් වැඩසටහන ආරම්භ කරන ලද අතර, (බෞද්ධ කටයුතු අමාත්‍යාංශය සමග) ආගමික ප්‍රජාවන් හරහා පාරිසරික කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන හරිත පුදමිබ් වැඩසටහන් වැනි මූලාරම්භයන් පරිමාණනය කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය සමග සහයෝගයෙන් තිරසර ජීවන රටාවන් ප්‍රචලිත කිරීමේ වැඩසටහන්ද දියත් කරන ලද අතර, එය තරුණයින් සහ ප්‍රජාවන් අතර තිරසර හැසිරීම් ප්‍රවර්ධනයට දායක වේ.







තිරසර සංවර්ධන සභාව

තිරසර ශ්‍රී ලංකාවක් - සංයුක්ත පරිණාමනයක්

ජනතා කේන්ද්‍රීය හරිත පුදබිම් සංකල්පය

අරමුණ

- දිවයින පුරා විසිර පවතින ආගමික ස්ථාන හරිත සහ ජනතා කේන්ද්‍රීය පුදබිම් බවට පත් කිරීමෙන් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ගමන්මඟ වේගවත් කිරීමට දායක කර ගත හැකි එක් ප්‍රධාන පාර්ශවයක් ලෙස හඳුනාගෙන ඇත.
- ජනතා කේන්ද්‍රීය හරිත පුදබිමක් බවට පත් කිරීමේ සංකල්පය පහත අංගයන්ගෙන් සමන්විත වේ.
- ආගමික ස්ථාන කේන්ද්‍ර කර ගත් මෙම සංකල්පය තිරසර සංවර්ධන උපායමාර්ගයක් ලෙස සමාජගත කිරීම හරහා පරිවර්තනීය වෙනසක් සහිත සමාජ වටපිටාවක් නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

හරිත පුදබිම



(1.) වගකීම් සහිත පරිභෝජනයට හුරුවෙමු - පරිසර හිතකාමී නිමැවුම් භාවිත කරමු
ආගමික ස්ථාන ආශ්‍රිතව පවතින ප්ලාස්ටික් මල් වට්ටි, පොලිතින් මල් මාලා, පොලිතින් මලු හා දාන ශාලා ආශ්‍රිත පිඟන්, කෝප්ප යනාදිය වෙනුවට පරිසර හිතකාමී පන් වට්ටි, මල් වලින් සෑදූ මල් මාලා භාවිතය, පොලිතින් භාවිතයෙන් තොර කලාපයක් බවට පත් කිරීම

(2.) අතිරික්ත අහාර බෙදා දෙමු - ආහාර සුරක්ෂිතතාව ඇති කරමු
ආගමික ස්ථාන ආශ්‍රිතව එකතු වන අතිරික්ත ආහාර දරිද්‍රතාවය හේතුවෙන් ආහාර සපයා ගත නොහැකි පවුල් අතර බෙදා දීමේ වැඩපිළිවෙලක් සැකසීම

(3.) කැළිකසල ප්‍රතිචක්‍රීකරණයට යොමු වෙමු - කසළ සම්පතක් කර ගනිමු
ආගමික ස්ථාන ආශ්‍රිතව එකතුවන ඉවත දමනු ලබන ආහාර, පූජා ද්‍රව්‍ය (මල්, ගිලන්පස, බෙහෙත් ද්‍රව්‍ය) ගස් වල වැටුණු කොළ වැනි දිරාපත් වන දෑ මඟින් කොම්පෝස්ට් පොහොර නිපදවීම හා ජීව වායු ඒකක වැනි ක්‍රම මඟින් ජීව වායු නිපදවීම

(4.) ජලය අපිරිමැස්මෙන් භාවිත කරමු - ජලය ප්‍රතිභාවිතයට යොමු වෙමු
ආගමික ස්ථාන ආශ්‍රිතව භාවිත වන ජලය පිරිමැසුම්දායීව භාවිතය හා ප්‍රතිභාවිතයට යොමු වීම සහ වැසි ජලය එක්රැස් කර උද්‍යාන කටයුතු යනාදියට භාවිත කිරීම

(5.) විදුලිය පිරිමසමු - විකල්ප බලශක්ති භාවිත කරමු
ආගමික ස්ථාන ආශ්‍රිතව අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම හා ආගමික උත්සව අවස්ථා වලදී විදුලි ආලෝකය ලබා ගැනීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභව භාවිත කිරීම

(6.) පළතුරු උයන් ඔසු උයන් ඇති කරමු - පරිසරය හා සෞඛ්‍ය සුවපත් කරමු
ආගමික ස්ථාන ආශ්‍රිතව භාවිතයට නොගෙන පවතින කුඩා ඉඩ ප්‍රමාණයක් භාවිත කර දුර්ලභ ශාක විශේෂ හා ඖෂධීය පැළෑටි වගා කර පළතුරු උයන් හා ඔසු උයන් ඇති කිරීම

03. SDG මූල්‍යකරණය

තිරසර සංවර්ධනය සඳහා මූල්‍ය යෙදවුම් වැඩිකර ගැනීම සඳහා SDCSL විසින් උපායමාර්ගික මුලපිරීම් කිහිපයක් සිදු කරන ලදී. මේ අතරින්, ශ්‍රී ලංකාවේ ප්‍රථම SDG ආයෝජක සිතියම සකස් කිරීම ප්‍රමුඛතම මූලාරම්භයක් ලෙස කැපී පෙනේ. 2022 අගෝස්තු මාසයේදී, SDCSL විසින් ආයෝජන මණ්ඩලය (BOI), ලංකා වාණිජ මණ්ඩලය සමග එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ඇතිව සිය ප්‍රථම SDG ආයෝජක සිතියම දියත් කරන ලදී. මේ සඳහා UNDP ආයතනය විසින් තාක්ෂණික සහාය ලබා දුන් අතර, ලංකා වාණිජ මණ්ඩලය මෙම ක්‍රියාවලිය සඳහා දැනුම් සහකරු ලෙස කටයුතු කළේ ය. ආයෝජක සිතියම මගින්, පුනර්ජනනීය බලශක්තිය, සෞඛ්‍ය සේවා, පාරිභෝගික භාණ්ඩ, යටිතල පහසුකම්, සහ ආහාරපාන වර්ග ප්‍රධාන ආයෝජන අංශ පහ සහ මෙම ක්ෂේත්‍ර තුළ ප්‍රමුඛතා උප අංශ 15 ක් හඳුනා ගන්නා අතර SDG සමග සමපාත වන ආයෝජන අවස්ථා ඉස්මතු කරයි.

ජාතික අයවැය විනිවිදභාවය සහතික කිරීම සහ කාර්යක්ෂමතාව හා සාධාරණත්වය විශ්ලේෂණය කිරීම සඳහා මෙන්ම අයවැයකරණය සහ ප්‍රතිපත්ති සම්පාදනය ශක්තිමත් කිරීම සඳහා පදනම දැමීමේ අරමුණින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට සහාය වී ජාතික අයවැය ක්‍රියාවලියට SDG අයවැය කේතීකරණ සහ ටැග් කිරීමේ පද්ධතියක් හඳුන්වා දීමට SDCSL සහ UNDP ශ්‍රී ලංකා විසින් ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (Green Finance Taxonomy) සකස් කිරීම සඳහා SDCSL විසින් තාක්ෂණික දායකත්වයන් ලබා දෙන ලද අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් දියත් කරන ලද අතර එය ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) තාක්ෂණික සහාය ඇතිව සංවර්ධනය කෙරිණි. හරිත මූල්‍ය වර්ගීකරණය, 2019 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දුන් තිරසර මූල්‍ය මාර්ග සිතියම මත පදනම්ව ශ්‍රී ලංකාවේ තිරසර/හරිත මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන ඇත. එය ප්‍රමුඛ පාරිසරික අරමුණු හා සම්බන්ධ නිශ්චිත ඉලක්ක සපුරාලීම සඳහා රටක් ගෙන යන ක්‍රියාකාරකම් හෝ ආයෝජන හඳුනා ගැනීම සඳහා වර්ගීකරණ පද්ධතියක් සපයන අතර, හරිත ලෙස තේරුම් ගන්නේ සහ ඒ සඳහා සුදුසුකම් ලබන්නේ කුමක්ද යන්න පිළිබඳව මූල්‍ය වෙළඳපල සහභාගිවන්නන් අතර පැහැදිලිකම සහ විනිවිදභාවය සඳහා වන අවශ්‍යතා ආමන්ත්‍රණය කරයි.

SDCSL හි ආරාධනයෙන්, ESCAP හි සංවර්ධනය සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ මූල්‍යකරණ අංශයේ දෙදෙනෙකුගෙන් යුත් දූත පිරිසක් රටේ වත්මන් සාර්ව ආර්ථික තත්ත්වය සන්දර්භය තුළ SDG සඳහා විවිධ මූල්‍ය විකල්ප සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාවට තෙදින සංචාරයක් සිදු කරන ලදී. පාර්ශ්වකරුවන්ගේ උපදේශන සහ ද්විපාර්ශ්වික සැලසුම් සාකච්ඡා හරහා, ශ්‍රී ලංකාවට SDG සඳහා වන නව්‍ය මූල්‍ය මාර්ග ඇතුළුව විවිධ ප්‍රතිපත්ති විකල්ප සමග සහාය වීමට සහ එහි ආර්ථික ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රයත්නයන්ට සහාය වීමට තාක්ෂණික සහාය සැලැස්මක් එහිදී හඳුනා ගැණින. මෙහි දී, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ණය, ප්‍රදාන සහ ජාතික වියදම් ක්‍රමවේද වලින් ඔබ්බට SDG සඳහා විකල්ප මූල්‍ය යෙදවුම් පිළිබඳව (ණය-සංවර්ධන හුවමාරු, තේමාත්මක බැඳුම්කර, මිශ්‍ර මූල්‍යකරණය වැනි) දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී


මෙයට අනුකූලව, රාජ්‍ය නිකුත් කිරීම් සඳහා තේමාත්මක බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ කොටසක් වන රාජ්‍ය ආයතනවල ධාරිතාව ගොඩනැගීම සඳහා සහ ශක්‍ය ව්‍යාපෘති මාර්ග හඳුනා ගැනීම සඳහා "තිරසර තේමාත්මක බැඳුම්කර නිකුත් කිරීම" පිළිබඳ දෙදින පුහුණුවක් 2022 දෙසැම්බර්

මාසයේදී සාර්ථකව පැවැත්විණි. මෙම පුහුණුව එක්සත් ජාතීන්ගේ ආසියා හා පැසිෆික් ආර්ථික හා සමාජ කොමිසම (ESCAP) විසින් ලක්සම්බර්ග් කොටස් වෙළඳපොළේ සහ LGX ඇකඩමියේ සම්පත් දායකත්වය ඇතිව පවත්වන ලදී. මෙම පුහුණුව, සහභාගිවන්නන්ට තේමාත්මක බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව දැනුම ලබාදුන් අතර, වඩාත්ම අදාළ උපකරණ හඳුනා ගැනීමට, මූලධර්ම, වර්ගීකරණයන්, බාහිර සමාලෝචන, සහ වාර්තාකරණය මෙන්ම කලාපය තුළ නිකුත් කිරීම් පිළිබඳ ප්‍රායෝගික උදාහරණ සහ සිද්ධි අධ්‍යයන සමාලෝචනය කිරීමේ හොඳම භාවිතයන් හඳුනා ගැනීමට හැකි විය. මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය (අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු නියෝජනය කරමින්), ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව, පරිසර අමාත්‍යාංශය, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ UNDP ශ්‍රී ලංකාවේ නිලධාරීන් මෙම වැඩමුළුවට සහභාගී විය.


ශ්‍රී ලංකා රජය විසින් හරිත බැඳුම්කර නිකුත් කිරීම සඳහා පදනම දැමීම සහ නිකුත් කරන ලද හරිත බැඳුම්කර උසස් තත්ත්වයේ බව, විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් අනුගමනය කරන බව සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූල බව සහතික කරමින් අනාගත තේමාත්මක බැඳුම්කර රාමු සඳහා යොමුවක් ලෙස සේවය කිරීම පිණිස මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ESCAP සමග සහයෝගයෙන් එහි ප්‍රථම රාජ්‍ය බැඳුම්කර රාමුව සැලසුම් කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී.








SDG Impact
SRI LANKA SDG INVESTOR MAP
Key Investment Opportunity Areas for Sri Lanka
Key Investment Opportunity Areas for Sri Lanka were identified and analyzed through a consultative stakeholder engagement process
05 Priority sectors
08 Priority sub-sectors
15 Immediate and medium-term IOAs have been identified


Zoom Meeting
Nohman Ishtiaq - UNDP
Dulani Sirisena - UND...
Introducing the SDG Budget Tracking System
Presentation to
Technical Working Committee
by Sustainable Finance Hub (UNDP)
5 Apr 2022
Participants (10)
Find a participant
Nadeeka Amarasinghe_SD... (Me)
Afraa Mohamed (Host)
Nohman Ishtiaq - UNDP
Janaka gunawardana. ADG Natio...
Dulani Sirisena - UNDP Sri Lanka
sagari bogahawatta
Shiranthi Ratnayake
Sri Lanka - Chamindry Saparama...
Sudarshana De Silva
Vagisha Gunasekera
Invite
Unmute Me









04. තිරසර සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම

පෞද්ගලික අංශය/ව්‍යාපාර රටක තිරසරභාවය කරා සංක්‍රමණය වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ධනය නිර්මාණය කිරීමේ, රැකියා උත්පාදනය කිරීමේ, සම්පත් භාවිතය, අපද්‍රව්‍ය උත්පාදනය වැනි ක්ෂේත්‍රවල නියෝජිතයන් ලෙස, ව්‍යාපාරික ආයතනයක සෑම ක්‍රියාකාරකමක්ම පරිසරය හා සමාජය සමඟ ධනාත්මක හෝ ඍණාත්මක ලෙස අන්තර්ක්‍රියා කරනු ලබයි. SDG න්‍යාය පත්‍රය හරහා, ව්‍යාපාර වඩාත් තිරසර මාවතක් කරා ගමන් කිරීම සඳහා වගකියනු ඇති බවට අපේක්ෂාවන් පවතී. විශේෂයෙන්ම පෙර නොවූ විරූ ගෝලීය අභියෝගයන් පවතින අවස්ථාවක, පෞද්ගලික අංශය, එහි අද්විතීය ශක්තීන්, සම්පත් සහ නවෝත්පාදනයට ඇති හැකියාව සමග ආර්ථික ස්ථායීකරණයේ සහ වර්ධනයේ එන්ජිමක් ලෙස සැලකිය හැකි ය.

SDG තුළ පෞද්ගලික අංශයේ කාර්යභාරය සැලකිල්ලට ගනිමින්, SDCSL විසින් පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කර, පෞද්ගලික අංශය SDG සමග සම්බන්ධ කර ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා රාමුවක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. එහි දී පහත කරුණු වෙත ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි:

- දැනුවත් කිරීම සහ අධ්‍යාපනික වැඩසටහන් හරහා SDG පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම;
- SDG සඳහා වන පෞද්ගලික ආයෝජන වැඩි කිරීම;
- ප්‍රමිතිකරණය, සහතික කිරීම සහ වාර්තාකරණය හරහා තිරසර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීම;
- SDG දත්ත සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.

SDCSL විසින් ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL), ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය, කොළඹ කොටස් වෙළඳපොළ (CSE) සහ එක්සත් ජාතීන්ගේ ගෝලීය සම්මුති ජාලය-ශ්‍රී ලංකාව ඇතුළත් මෙහෙයුම් කමිටුවක් පත් කර එය ක්‍රියාත්මක කිරීම සඳහා රාමුවක් සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ද සිදු කර ඇත. එය අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීම සහ එහි ක්‍රියාකාරී ප්‍රගතිය නිරීක්ෂණය කිරීම හා ඇගයීම වෙනුවෙන් සභාව ක්‍රියා කරයි.

SDCSL විසින් ගෝලීය ESG (පාරිසරික, සමාජීය, පාලන) රාමු වලට අනුකූලව තිරසර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීමට සහ ආයතනික තිරසරභාවය වාර්තා කිරීම ශක්තිමත් කිරීමටද මූලාරම්භයන් ගන්නා ලදී. උදාහරණයක් ලෙස, එය හරිත හා සමගාමී ව්‍යාපාරික පිළිවෙත් අනුගමනය කිරීමට සහ ජාත්‍යන්තර තිරසරභාවය පිළිබඳ ප්‍රමිති සමග ඔවුන්ගේ වාර්තාකරණය සමපාත කිරීමෙන් විනිවිදභාවය වැඩි දියුණු කිරීමට සමාගම් දිරිමත් කරන ලදී. ලංකා වාණිජ මණ්ඩලය, කොළඹ කොටස් වෙළඳපොළ, එක්සත් ජාතීන්ගේ ගෝලීය සම්මුති ජාලය ශ්‍රී ලංකාව, සහ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය ඇතුළු ආයතන සමඟ සහයෝගයෙන් පවත්වන ලද ඉලක්කගත වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යාපාරවල තිරසරභාවය පිළිබඳ ප්‍රයත්නයන් ජාතික SDG ඉලක්ක සමග අනුරූපණය කිරීමට උපායමාර්ගිකව භාවිතා කරන ලදී. හොඳම භාවිතයන් සහ ගෝලීය වාර්තාකරණ සම්මතයන් ප්‍රවර්ධනය කිරීමෙන්, SDCSL ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු කරා පෞද්ගලික අංශයේ ආයෝජන සහ නවෝත්පාදනයන් ඵලදායී ලෙස යොමු වී ඇති බව සහතික කිරීමට මෙමඟින් දායකත්වය සපයනු ලැබේ.


திரசர ශ්‍රී ලංකාවක් - සංයුක්ත පරිණාමනයක්
- An inclusiv
ormation

05. SDG අධීක්ෂණය සහ ඇගයීම:

සාක්ෂි මත පදනම් වූ සැලසුම්කරණය සහ ඇගයීම ශක්තිමත් කිරීම සඳහා, SDCSL ප්‍රධාන SDG දර්ශක පිළිබඳ දත්ත කාලෝචිත ලෙස ලබා ගත හැකි බව සහතික කරන ශක්තිමත් දත්ත කළමනාකරණ සහ වාර්තාකරණ පද්ධති ස්ථාපිත කර ඇත. මෙම පද්ධති මගින් විවිධ අංශවල පාර්ශ්වකරුවන්ට ජාතික ප්‍රගතිය වඩාත් ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීමට සහ කාලෝචිත හා සුදුසු පරිදි ප්‍රතිපත්තිමය ප්‍රතිචාර දැක්වීමට හැකියාව ලබා දී ඇත.

ජාතික SDG දත්ත ද්වාරය දියත් කිරීමත් සමග, SDCSL විසින් දත්ත ගොනු කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතන 80 කට අධික සංඛ්‍යාවක් මධ්‍යම වේදිකාවකට සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ SDG දත්ත පාලනය සහ කළමනාකරණ පද්ධතිය ආරම්භ කරන ලදී.

2022 වසරේ ESCAP සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරන ලද විශ්ලේෂණයට අනුව, ආසියා-පැසිෆික් කලාපයේ රටවල් 53 න් ශ්‍රී ලංකාව SDG දත්ත ලබා ගැනීමේ හැකියාව අතින් 10 වන ස්ථානයට පත්ව ඇත. විවෘත SDG දත්ත හරහා විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීමට වන කැපවීම පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාව දකුණු හා නිරිතදිග ආසියා කලාපයේ, තුන්වන ස්ථානයේ සිටී.

SDG දත්තවල ලබා ගැනීමේ හැකියාව සහ විස්තීරණත්වය තවදුරටත් සහතික කිරීම සඳහා, SDCSL විසින් පවතින දත්ත පරතරය තවදුරටත් අඩු කිරීම සහ ශ්‍රී ලංකාවේ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා නව ක්‍රමවේදයන් සහ ශිල්පීය ක්‍රම සමග දත්ත උත්පාදනය සහ සම්පාදනය සඳහා අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන තුළ ධාරිතා වර්ධනයට ප්‍රමුඛත්වය දෙන ලදී. UNDP, ESCAP සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන්, SDCSL විසින් දත්ත උත්පාදනය, වලංගුකරණය සහ විශ්ලේෂණය සඳහා ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම අරමුණු කරගත් විශේෂිත පුහුණු හා තාක්ෂණික සහාය වැඩසටහන් පවත්වන ලදී. මෙම ප්‍රයත්නයන් දත්ත පරතරයන් ආමන්ත්‍රණය කිරීමට, දර්ශක මිනුම් ප්‍රමිතිකරණයට සහ ශ්‍රී ලංකාවේ ජාතික SDG වාර්තාකරණයේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට උපකාරී විය. මෙම ඒකාබද්ධ ප්‍රවේශය හරහා, SDCSL විසින් තිරසර සංවර්ධන ප්‍රතිඵල කරා මෙහෙයවීමේ දී දත්තවල මූලික කාර්යභාරය ශක්තිමත් කරන ලදී.


තවද, SDGs දේශීයකරණය කිරීම සහ ශක්තිමත් අධීක්ෂණය සහ ඇගයීම සඳහා ESCAP විසින් යෝජනා කරන ලද ක්‍රමවේදය භාවිතා කරමින් SDG ජාතික ඉලක්ක අගයන් සැකසීම පිළිබඳ දැනුම බෙදා ගැනීමට "SDG ප්‍රගති තක්සේරුව සඳහා ජාතික ඉලක්ක සැකසීම" පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ සම්මන්ත්‍රණයක් 2022 සැප්තැම්බර් මාසයේ දී සාර්ථකව පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණය ශ්‍රී ලංකාවේ SDG ප්‍රගතිය ඇගයීම සඳහා අධීක්ෂණ හා ඇගයීම් (M&E) රාමුවකට ඒකාබද්ධ කළ හැකි SDG ඉලක්ක සංවර්ධනය කිරීම සඳහා පදනම දැමීය.

සම්මන්ත්‍රණයේදී, SDG ප්‍රගති තක්සේරුවේ විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා M&E රාමුවක් සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. ඉලක්ක සැකසීමේ ක්‍රියාවලියට යථාර්ථවාදී සහ අභියෝගාත්මක ඉලක්ක සැකසීම සඳහා "සම්මත සහ සාක්ෂි මත පදනම් වූ

ප්‍රවේශයක්" අනුගමනය කිරීම, ඉලක්ක සැකසීම සඳහා සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම, සහ රජය තුළ ඒවායේ හිමිකාරිත්වය සහ අංශගත සැලසුම්වලට SDG ඉලක්ක අනුකලනය කිරීම ඇතුළත් විය.

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වැනි ප්‍රධාන ජාතික සැලසුම් ආයතන සහ රේඛීය අමාත්‍යාංශ 24 ක් නියෝජනය කරන සහභාගිවන්නන් 70 ක් මෙම සම්මන්ත්‍රණයට සහභාගී විය.





06. ස්වේච්ඡා ජාතික සමාලෝචනය **(VNR) 2022**

2022 දී, SDCSL විසින් ශ්‍රී ලංකාවේ දෙවන ස්වේච්ඡා ජාතික සමාලෝචනය (VNR) සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. රාජ්‍ය අමාත්‍යාංශ, පෞද්ගලික අංශය, සිවිල් සමාජ සංවිධාන, ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් (බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික), ස්වේච්ඡාවෙන් කටයුතු කරන්නන් සහ ස්වේච්ඡා කණ්ඩායම්, තරුණයින් සහ ශාස්ත්‍රඥයින් ආදිය ඇතුළත් පුළුල් පරාසයක බහුවිධ පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීමක් සිදු කෙරිණි. විවිධ තේමාත්මක, ජාතික සහ පළාත් මට්ටමේ උපදේශන හරහා ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගන්නා ලදී. සමස්තයක් වශයෙන්, සමාලෝචන ක්‍රියාවලියේ පුළුල් නියෝජනයක් සහතික කරමින් මෙම උපදේශන සහ කේන්ද්‍ර කණ්ඩායම් සාකච්ඡා සඳහා පාර්ශ්වකරුවන් 700 කට අධික සංඛ්‍යාවක් සහභාගී කර ගන්නා ලදී.

VNR ක්‍රියාවලිය SDCSL, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD), ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (DPMM), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS), අග්‍රාමාත්‍ය කාර්යාලය (PMO), විදේශ කටයුතු අමාත්‍යාංශය (MFA), ශ්‍රී ලංකා මුදල් කොමිෂන් සභාව, පරිසර අමාත්‍යාංශය සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත ජාතික මට්ටමේ මෙහෙයුම් කමිටුවක් විසින් මෙහෙයවන ලදී. එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකරණ කාර්යාලය (UNRCO), ලෝක බැංකුව (WB) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) නිරීක්ෂකයින් ලෙස කටයුතු කළේ ය.

SDCSL, ඒකාබද්ධ වැඩමුළු, මාර්ගගත හුවමාරු සහ විශේෂඥ අධ්‍යයන චාරිකාවක් හරහා පාකිස්තානය (2022 දී එහි දෙවන VNR සකස් කරමින් සිටී) සමග හවුල් වෙමින් ESCAP VNR නිවුන් වැඩසටහනටද සම්බන්ධ විය. මෙම සහයෝගීතාවය මගින් ආයතනික විධිවිධාන සහ SDG ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් සහ හොඳම භාවිතයන් හුවමාරු කර ගැනීමට රටවල් දෙකටම හැකි විය.

VNR සකස් කිරීම සහ SDG ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා සම්සුරු සහාය ලබා දීම සඳහා දකුණු-දකුණු සහයෝගීතා යාන්ත්‍රණයන්ගෙන් එකක් ලෙස ESCAP විසින් ශ්‍රී ලංකාවට සහ පාකිස්තානයට VNR නිවුන් වැඩසටහන හඳුන්වා දෙන ලදී.

මෙම වැඩසටහනෙහි ප්‍රධාන මෙවලම් වූයේ දැනුම හුවමාරු/සම්සුරු ඉගෙනීම සඳහා කැපවූ මාර්ගගත වේදිකාව, VNR වාර්තා කෙටුම්පත් වල සම්සුරු සමාලෝචනය සහ රටවල් මට්ටමේ SDG ක්‍රියාවලියේ ප්‍රධාන සාමාජිකයින් සහ අනෙකුත් වැදගත් පාර්ශ්වකරුවන් සඳහා යුගල කළ රටවල් අතර අධ්‍යයන චාරිකාවයි.

අවසන් කරන ලද VNR වාර්තාව 2022 ජූලි මාසයේදී එක්සත් ජාතීන්ගේ ඉහළ පෙලේ දේශපාලන සංසදයේ දී (United Nations High-Level Political Forum) සාර්ථකව ඉදිරිපත් කරන ලදී. 2030 න්‍යාය පත්‍රයේ විධිමත් එක්සත් ජාතීන්ගේ සමාලෝචනයේ කොටසක් ලෙස, SDGs සාක්ෂාත් කර

ගැනීම සඳහා වූ ජයග්‍රහණ සහ අභියෝග යන දෙකම ඉස්මතු කරමින් වාර්තාව SDG න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ ප්‍රගතිය මෙහිදී ඉදිරිපත් කරන ලදී.











SRI LANKA (VNR)


SUSTAINABLE DEVELOPMENT GOALS
VOLUNTARY NATIONAL REVIEW (VNR) 2022
TWINNING PROGRAM STUDY TOUR
SRI LANKA TO PAKISTAN

07. SDG වාර්තාකරණය

2022 මාර්තු මාසයේදී පැවති තිරසර සංවර්ධනය පිළිබඳ නවවන ආසියා-පැසිෆික් සංසදයේ දී (APFSD), පශ්චාත්-වසංගත සමයේදී අත්පත් කරගත් සංවර්ධන ප්‍රතිඵල ආපසු හැරවීමට ඉඩ නොදෙන බවට සහතික වීම සඳහා ශක්තිමත් කලාපීය ආර්ථික සහයෝගිතාවයක අවශ්‍යතාවය අවධාරණය කරමින්, නිල වාර්තාකරණය සහ රටේ ප්‍රකාශ ඉදිරිපත් කිරීම තුළින් SDCSL ප්‍රධාන කලාපීය හා ගෝලීය SDG සංසදයන්හිදී ශ්‍රී ලංකාවේ මැදිහත්වීම සම්බන්ධ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලදී. තවද, SDG මැදිහත්වීම්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම පිණිස කලාපීය ආර්ථික සහයෝගිතාවය සහ සාමූහික කලාපීය ක්‍රියාමාර්ග සඳහා සහාය වීමට ශ්‍රී ලංකාවේ කැපවීම මෙම සංසදයන්හිදී නැවත අවධාරණය කෙරිණි. SDG ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යකරණය විවිධාංගීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ ප්‍රයත්න, SDG සැලසුම් සහ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ත රජයේ සහ සමස්ත සමාජයේ ප්‍රවේශයක් අනුගමනය කිරීම, ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා සංඛ්‍යාලේඛන පද්ධති වැඩිදියුණු කිරීම, විද්‍යා හා තාක්ෂණ ධාරිතාවන් සහ නවෝත්පාදන (STI) හැකියාවන් සඳහා ආයෝජන සහ සංසදය තුළ ඩිජිටල්කරණය ඇතුළු පස්වන දකුණු ආසියානු SDG සංසදයෙන් මතුවූ වැදගත් නිර්දේශයන්ටද ශ්‍රී ලංකාව සහාය විය.

පාකිස්තානයේ ඉස්ලාමාබාද්හි පැවති SDG පිළිබඳ හයවන දකුණු හා නිරිතදිග ආසියානු සංසදයේදී SDCSL විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද අතර, පශ්චාත්-වසංගත යුගයේදී ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ ආර්ථික හා අනෙකුත් අභියෝග හේතුවෙන් අත්පත් කරගත් සංවර්ධන ප්‍රතිඵල ආපසු හැරවීමට ඉඩ නොදෙන බවට ශ්‍රී ලංකා රජයේ කැපවීම ප්‍රදර්ශනය කරන ලදී. තවද, ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේ සහ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්හිදී අවදානමට ලක්විය හැකි සහ ආන්තික කණ්ඩායම් පෙරමුණට ගෙන ඒම සහතික කරමින්, අපනයන-නැඹුරු තරගකාරී ආර්ථිකයක්, පරිසර හිතකාමී නීල-හරිත ආර්ථිකයක් සහ ඩිජිටල් ආර්ථිකයක් මත පදනම් වූ නව ආර්ථික ආකෘතියක සම්පූර්ණ විභවය උපයෝගී කර ගැනීමට ඇති කැපවීම සමග සාර්ව ආර්ථික ස්ථායීතාවය සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීමට රජයේ කැපවීමද අවධාරණය කරන ලදී.

මීට අමතරව, අප්‍රේල් මාසයේ ESCAP කොමිෂන් සභා සැසිවාරයේ 77 වන සැසිවාරයේදී සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේදී ඉදිරිපත් කිරීම සඳහා SDG ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාතික මට්ටමේ යාවත්කාලීන කිරීම් සහ රටේ ප්‍රකාශ සඳහා අවශ්‍ය දායකත්වයන් විදේශ කටයුතු අමාත්‍යාංශයට ලබා දෙන ලදී.

මෙම මැදිහත්වීම් ශ්‍රී ලංකාවේ SDG ජයග්‍රහණ සහ අභියෝග ඉස්මතු කිරීමට, SDG ක්‍රියාත්මක කිරීම සඳහා ගෝලීය හා කලාපීය හවුල්කාරිත්වයන් සහ සහයෝගිතාවය ශක්තිමත් කිරීමට, සහ කලාපීය හා ගෝලීය තිරසර සංවර්ධන සාකච්ඡා හැඩගැස්වීමට SDCSL සඳහා වැදගත් වේදිකාවන් විය.




ZERBAIJAN
VICE-CHAIR
SRI LANKA


SDPI
Silver Jubilee Sustainable Development Conference
AINABLE DEVELOPMENT IN UNUSUAL TIMES:
UILDING FORWARD BETTER
5 - 8 December 2022
Plenary 1.2
Opening Plenary:
25th SDC & 6th SDGF
WATCH LIVE AT:
sdpi.tv/live

08. SDG අධ්‍යාපනය සහ ධාරිතා සංවර්ධනය

අධ්‍යාපනය, පර්යේෂණ සහ ධාරිතා සංවර්ධනය තුළින් ශ්‍රී ලංකාව තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් කරා ගෙන යාමේ දැක්ම SDCSL සතුව ඇත. ඒ අනුව, SDCSL විසින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනය සඳහා තිරසරභාවය පිළිබඳ අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ අධ්‍යයන හා උසස් අධ්‍යාපන ආයතන සමග සම්බන්ධ විය.

ඉහත දැක්ම ක්‍රියාත්මක කරමින්, විශේෂඥ දැනුම හා ඉගෙනුම් සම්පත් බෙදා ගැනීම, ශාස්ත්‍රඥයින්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සඳහා තාක්ෂණික සැසි සඳහා පහසුකම් සැලසීම හා පැවැත්වීම, සහයෝගිතා පර්යේෂණ හා ප්‍රකාශන ආරම්භ කිරීම, විවෘත දත්ත බෙදා ගැනීම සහ පාසල් ඇතුළු අධ්‍යාපනයේ සියලු මට්ටම්වල තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම යනාදිය අරමුණු කරගනිමින් SDCSL සහ NSBM හරිත විශ්වවිද්‍යාලය SDG හා සම්බන්ධ පර්යේෂණ හා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා හවුල්කාරිත්වයකට එළඹුණි.

තවද, NSBM හරිත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුම බෙදා ගැනීමේ සැසියක් සාර්ථකව පවත්වන ලදී මෙම සැසියේ අරමුණ වූයේ SDG ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය, රජයේ මෑත කාලීන මූලාරම්භයන්, SDG දත්ත පාලන හා කළමනාකරණ පද්ධතිය, විශ්වවිද්‍යාල තිරසරභාවය මැනීම සඳහා ඉලක්ක සහ දර්ශක මෙන්ම පරිසර ව්‍යාපාර සහ ආයතනික තිරසරභාවය පිළිබඳ ප්‍රවේශයන් සහ භාවිතයන් පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමයි.

තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා සහ අධ්‍යාපනය, පර්යේෂණ, විෂයමාලා සංවර්ධනය සහ තිරසර සංවර්ධනය පිළිබඳ විද්‍යුත් ඉගෙනීම යන ක්ෂේත්‍රවල සහයෝගිතාව සඳහා කැලණිය විශ්වවිද්‍යාලය සහ SDCSL හවුල්කාරිත්වයකට එළැඹිණි.

පුස්තකාල හා තොරතුරු සේවා සහ ඊට අදාළ වැඩසටහන් තුළින් 2030 න්‍යාය පත්‍රය සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම සඳහා තිරසර සංවර්ධනය සඳහා අධ්‍යාපනයට දායක වෙමින්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) ද SDCSL සමග ගිවිසුමකට එළැඹියේ ය.

SDG සාක්ෂාත් කර ගැනීමට සහාය වන පුස්තකාල හා තොරතුරු සේවා, ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම, තිරසරභාවය සහ තිරසර සංවර්ධනය පිළිබඳ ප්‍රජාවන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසිවලට පහසුකම් සැලසීම හා පැවැත්වීම, හවුල්කාර ආයතන දෙක අතර සම්පත්දායකයන් සහ ඉගෙනුම් සම්පත් බෙදා ගැනීම, පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යාපන වැඩසටහන් වලට තිරසර සංවර්ධනය සහ SDGs හඳුන්වා දීම යනාදිය එහි අරමුණු විය. රජයේ පුස්තකාල, විශ්වවිද්‍යාල සහ පාසල් පුස්තකාල, තාක්ෂණික විද්‍යාලවල පුස්තකාල, පිරිවෙන් සහ රජයේ දෙපාර්තමේන්තු ඇතුළු විවිධ අංශවල SLLA ජාලය තුළ ක්‍රියාත්මක වන පුස්තකාල 1,000 කට අධික සංඛ්‍යාවක සක්‍රීය පුස්තකාල සාමාජිකත්ව 100,000 ට අධික සංඛ්‍යාවක් වෙත ප්‍රවේශ වීමට මේ හරහා අපේක්ෂා කෙරේ.

රාජ්‍ය අංශයේ ධාරිතාවන් ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට (SLIDA) අලුතින් බඳවා ගනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරීන් සඳහා සකස් කරන ලද SDG මොඩියුල හරහා අවශ්‍ය දැනුම ලබා දීමට SDCSL විසින් තාක්ෂණික සහාය ලබා දෙනු ලැබිණි.

SDCSL විසින් අධ්‍යයන සම්මන්ත්‍රණ, වෘත්තීය සංසද සහ මහජන උත්සවවල ඉලක්කගත කතාබහ තුළින් මෙම ප්‍රයත්නයන් තවදුරටත් පුළුල් කරන ලදී. බිම් මට්ටමේ දී, පාසල් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් තුළ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ "තිරසර ජීවන රටා" වැඩසටහන් සඳහා SDCSL විසින් සහාය ලබා දුන් අතර, අපද්‍රව්‍ය වෙන් කිරීමේ සිට බලශක්ති සංරක්ෂණය දක්වා තිරසර ජීවන රටාව ශක්තිමත් කරන ප්‍රායෝගික පුරුදු ඉහළ නැංවීමට අවශ්‍ය දැනුමින් එම ප්‍රජාව පෝෂණය කරන ලදී.

විශ්වවිද්‍යාලවල සහ ප්‍රජා මට්ටමේ SDG ප්‍රචාරණ කටයුතු සඳහා ශිෂ්‍ය උපදේශකයින් සවිබල ගැන්වීමට, G17 විශ්වවිද්‍යාල තානාපති වේදිකාව බලමුලු ගන්වා SDCSL විසින් "Road to Rights" නම් සිවිල් සමාජ තරුණ ව්‍යාපාරය සමග එක්ව දැනුම බෙදා ගැනීමේ සැසි පැවැත්වී ය. මීට අමතරව, කඩමණ්ඩිය ආහාර බැංකුව සහ ධීවර හා සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය සමඟ එක්ව දැනුවත් කිරීමේ සැසි කිහිපයක් පවත්වන ලදී.

රාජ්‍ය මාධ්‍ය නාලිකා හරහා පුළුල් පරාසයක පාර්ශ්වකරුවන් අතර SDG පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා SDCSL විසින් ජනාධිපති මාධ්‍ය අංශය සහ ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානය සමඟ සමීපව කටයුතු කළේ ය.

ඒ සමගම, සංකීර්ණ SDG මාතෘකා ප්‍රවේශ විය හැකි තොරතුරු-රූප සටහන්, කෙටි වීඩියෝ, සහ අන්තර්ක්‍රියාකාරී ප්‍රශ්නාවලි බවට පරිවර්තනය කිරීමට Facebook, Twitter සහ Instagram වැනි වේදිකා හරහා ගතික ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ව්‍යාපාර නිර්මාණය කළේ ය. මෙම බහුවිධ ප්‍රචාරණ ප්‍රයත්නයන් විවිධ ප්‍රේක්ෂකයින් අතර දැනුවත්භාවය ඉහළ නැංවූවා පමණක් නොව, මාර්ගගත සම්බන්ධතා සහ ප්‍රජා සහභාගීත්වය සැලකිය යුතු ලෙස වැඩි කිරීමටද හේතු විය. එය ශ්‍රී ලංකාවේ 2030 න්‍යාය පත්‍රය සඳහා තිරසර සහාය සඳහා පදනම දැමීමට උපකාරී වේ.











FOCUS/SPOTLIGHT

GENDER EQUALITY

A long road ahead

BY SASIKA HANNEN

When will our country, with its 52% population of women and those who identify as women, who also comprise 56% of the voter base, achieve gender equality?

According to the Gender Inequality Index 2018, Sri Lanka ranks at 80 with a value of 0.393 out of 162 countries based on three dimensions of gender-based inequalities – reproductive health, empowerment, and economic activity. Today we may have fallen a few more positions as we face crisis after crisis.

A recent visit to a tea factory operating in Gampola that used to employ about 100 women from the vacancy provided some insight – due to the drop in exports and the factory having to cut back on expenses to keep functioning, about 75 women had been laid off from work.

Speaking to *The Sunday Morning*, a member of the administrative and guest entrance staff explained: "Most of these women were involved in maintaining the plant nursery and the tea-plucking and sorting process. We had to reduce the number of workers employed as the salary and labour force is a major cost we have to consider paying their daily wage of Rs. 1,000 when enough started to dwindle. Even the administrative staff faced allowance deductions and now we are only paid the basic salary."

The staffer said that most of these women lived near the factory and only 25 women employees who worked with the machinery and around five men who drove the lorries and did labour-intensive work still remained employed.

"It is easier to reason with women. When we broke the news that we would no longer be able to keep them employed, the women understood. Most of them are just home-bound at the moment and hopefully when the economy gets back on the road to recovery, we will be able to bring them back."

This reflects the gender inequality that is still prevalent in our country, especially in the informal sector.

UN SDG Goal 5

Given that achieving gender equality is Goal 5 under the UN Sustainable Development Goals (SDGs) 2030, *The Sunday Morning* reached out to Sustainable Development Council Head Chinnadry Saparamadu on where Sri Lanka stood in terms of achieving it by 2030.

"Although as an overall sense the percentages doesn't look promising, recent surveys in education indicate that girl children have a higher tendency to complete 13 years of school education. Even if we take the number of university entrants, the percentages for women seem to be increasing. However, we do not see the literacy gained through general and university education translating equally to the labour force," Saparamadu highlighted.

According to the Sri Lanka Labour Force Survey Annual Bulletin (2020) issued by the Department of Census and Statistics, women account for a mere 35.4% of the labour force in comparison to 77.4% for men. The youth unemployment rate for women is at 34.3% compared with 21.3% for men.

"The representation of women in decision-making levels in the private sector is at 30%, which is a considerable improvement over the past years, yet only about 13% of women graduates hold managerial positions, especially as relates to Science, Technology, Engineering, and Mathematics (STEM). Even in top Government positions, we only see a very few women functioning as leaders and managers," Saparamadu elaborated.

Saparamadu added that Sri Lanka over the years through its policies and frameworks had improved gender parity at various levels. "If we take literacy and violence against women in public as well as domestic settings, that in itself poses a considerable challenge in empowering women to be active contributors to the economy. The lack of a social safety net, lack of access to a safe and functional public transport service, lack of acknowledgement of their unpaid contribution of labour in domestic settings, and lack of knowledge of reproductive health play a role in hindering women from progressing in their careers or reaching their true potentials.

As indicated in the Women's Wellbeing Survey (2019), 35.3% of women in Sri Lanka believe that men can have a good reason to hit their wives and 47.3% of women feel that men are superior to women. Our as five corresponded women have experienced physical and/or sexual violence in their lifetime and crimes such as Covid-19 have intensified violence against women in the country.

Women in politics

Women Parliamentarians' Caucus Chairperson Dr. Sudarshani Fernandopulle sharing her views with *The Sunday Morning* on the importance of networking to improve political rights of women said: "During research conducted earlier this year, with the participation of six major political parties, we understood the political involvement of women in Sri Lanka was low. Even in Parliament where we have 12 women MPs out of 225, our voices often go unheard. In order to raise a voice that can surpass the other 213, it's important to network with the 25% of Local Government women councillors."

She said that the political participation of women was essential and that she was committed to delivering any attempt to reduce the 25% quota for women's representation in Local Government bodies. She added that several initiatives were in place to ensure gender equality and a special Parliamentary Select Committee had been appointed for this purpose.

Dr. Fernandopulle pointed out that although the 12 MPs were from different parties, they stood together on women's issues and worked together as a forum for women MPs on the event of injustice being faced by an MP.

Addressing bottlenecks

What is blocking women in Sri Lanka from participating in and actively contributing to the labour force?

